මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය
நிதி, திட்டமிடல் மற்றும் பொருளாதார அபிவிருத்தி அமைச்சு
MINISTRY OF FINANCE, PLANNING AND ECONOMIC DEVELOPMENT

මහලේකම් කාර්යාලය, කොළඹ 01, ශ්‍රී ලංකාව.
செயலகம், கொழும்பு 01. இலங்கை.
The Secretariat, Colombo 01. Sri Lanka.

කාර්යාලය / அலுவலகம் / Office: 011 - 2484500, 011 - 2484600, 011 - 2484700
ෆැක්ස් / தொலைநகல் / Fax: 011 - 2449823
වෙබ් අඩවිය / இணையத்தளம் / Website: www.treasury.gov.lk

මගේ අංකය / எனது இல. / My No.: DMS/Salary Revision/ 2025-I
ඔබේ අංකය / உமது இல. / Your No.:
දිනය / திகதி / Date: 2025.04.24

කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක : 05/2025 (I)

ලේකම්
ආරක්ෂක අමාත්‍යාංශය

**<u>ත්‍රිවිධ සන්නද්ධ හමුදා සේවා පුද්ගලයින් සඳහා වන වැටුප් සංශෝධනය - 2025</u>**

උක්ත මැයෙන් යුතුව සිංහල භාෂාවෙන් නිකුත් කර ඇති 2025.03.25 දිනැති කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක: 05/2025 හි 07.1 ඡේදය සංශෝධනය කිරීමට 2025.04.01 දින පැවති අමාත්‍ය මණ්ඩල රැස්වීමේදී අනුමැතිය ලබා දී ඇත.

2. ඒ අනුව කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක: 05/2025 හි 07.1 ඡේදය පහත පරිදි සංශෝධනය කරනු ලැබේ.

07.1 2025.01.01 දින ද සේවයේ යෙදී සිට අවසන් වරට 2025.03.31 දින සේවයෙන් පසු හෝ එදිනට පෙර දිනයක සේවයෙන් පසු හෝ විශ්‍රාම ගනු ලබන නිලධරයන්ගේ මාසික විශ්‍රාම වැටුප මෙම චක්‍රලේඛයෙහි උපලේඛන I හි සඳහන් නව වැටුප් පරිමාණ මත පදනම්ව සකස් කළ යුතු අතර, එසේ සකස් කරන ලද විශ්‍රාම වැටුප 2025.07.01 දින සිට ගෙවනු ලැබේ. 2025.06.30 දින තෙක් මෙම නිලධරයන්ට ගෙවිය යුත්තේ 2016.04.29 දිනැති කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක : 03/2016 අනුව සකසන ලද මාසික විශ්‍රාම වැටුප වේ. එම නිලධරයන්ගේ විශ්‍රාම වැටුප් පාරිතෝෂිකය මෙම චක්‍රලේඛයෙහි සඳහන් නව වැටුප් පරිමාණය මත පදනම්ව සංශෝධනය නොකළ යුතුය.

ඒ. කේ. සෙනෙවිරත්න
භාණ්ඩාගාරයේ නියෝජ්‍ය ලේකම් සහ
මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යාංශයේ ලේකම් (වැ.බ.)

පිටපත් :
1. ජනාධිපති ලේකම්
2. අග්‍රාමාත්‍ය ලේකම්
3. අමාත්‍ය මණ්ඩලයේ ලේකම්
4. විගණකාධිපති
5. අධ්‍යක්ෂ ජනරාල්, විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව